**ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය - 2016**

**-----------------------------------------**

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උපවගන්තිය සහ 108 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන  ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත්, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978  අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 111 වගන්තිය ප්‍රකාරව  විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-----

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 2.2.1 ලැබිය යුතු හා ගෙවියයුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ විවිධ අත්තිකාරම් ලෙස දක්වා තිබූ රු. 1,403,810 ක් වූ ශේෂය තුළ ඇතුළත් වර්ෂ 10 සිට වර්ෂ 15 දක්වා පැරණි රු. 684,373 ක අත්තිකාරම් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

(ආ) රසායන විද්‍යාගාර ගොඩනැගිල්ල හා නව කලාගාරය අළුත්වැඩියා කිරීමේ කාර්ය කොන්ත්‍රාත්කරු අත්හැර ගොස් තිබුණු බැවින් 2012 අප්‍රේල් 25 දින කොන්ත්‍රාත්තුව අවලංගු කර තිබුණි. එසේ වුවද, කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණු රු. 2,268,483 ක අත්තිකාරම් මුදලින් ආවරණය නොකළ වැඩ වෙනුවෙන් අයවිය යුතු රු. 1,764,013 ක් කාර්යසාධන බැඳුම්කරයෙන් අයකරගෙන නොතිබුණු අතර එම මුදල කොන්ත්‍රාත්කරුගෙන් අය කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදීද කටයුතු කර නොතිබුණි.

(ඇ) අධ්‍යයන නිවාඩු ලබා විදේශ ගත වූ නිලධාරීන් 58 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ අවසානයට බැඳුම්කර කඩකිරීම වෙනුවෙන් අයවිය යුතු ශේෂය රු.79,046,345 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂ 2 තුළදී බැඳුම්කර වටිනාකම් අයකර ගැනීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කළ නමුත් මෙතෙක් අයකර නොගත් වර්ෂ 1 සිට වර්ෂ 9 දක්වා වූ බැඳුම්කර වටිනාකම රු. 43,498,359 ක් වූ අතර වසර 10 ඉක්මවූ වටිනාකම රු.35,547,986 ක් විය.

(ii) නිලධාරීන් 6 දෙනෙකුගේ එකතුව රු. 3,654,787 ක් වූ බැඳුම්කර ශේෂ සේවක අර්ථසාධක අරමුදලෙන් හිළව් කර ගැනීමට අපේක්ෂා කරන බව දක්වා තිබුණද ඉන් නිලධාරීන් තිදෙනෙකුට අදාළ එකතුව රු. 2,306,402 ක්වූ අර්ථසාධක අරමුදල් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් බැඳුම්කර අයකර ගැනීමකින් තොරව නිදහස් කර තිබුණි.

(ඈ) සේවයෙන් ඉවත්ව ගිය විශ්වවිද්‍යාල සේවකයන් 07 දෙනෙකුගෙන් අයවිය යුතුව තිබූ රු. 516,709 ක් වූ ආපදා ණය ශේෂ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට පියවර ගෙන නොතිබූ අතර ඉන් වසර 5 ඉක්ම වූ සේවකයන් 6 දෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ එකතුව රු. 463,259 ක් විය.

(ඉ) මියගිය සේවකයෙකුගෙන් අයවිය යුතු රු. 168,850 ක් වූ ණය ශේෂ ඇපකරුවන්ගෙන් හෝ සේවක අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සේවයෙන් පහකර තිබුණු සේවකයන් දෙදෙනෙකුගෙන් අයවිය යුතුව තිබුණු රු.148,678 ක ණය ශේෂ වසර 7 කට වැඩි කාලයක සිට හිඟ හිටව පැවතුණි.

### 2.2.2 නීතිරීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහය | |
| (i) IX පරිච්ඡේදයේ 4.1 වගන්තිය | අතිකාල දීමනා ලබාගැනීමට අතිකාල වැඩ නියම වශයෙන් හා සාධාරණ වශයෙන් කර ඇති බවට විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා පෞද්ගලිකව සෑහීමකට පත්විය යුතුය. ඒ අනුව අතිකාල වේලාවන්හිදී නියම වැඩ ප්‍රමාණයක් කෙරෙන බවටත් නිකරුනේ ගත කළ කාලයට ගෙවීමක් නොකෙරන බවටත් සෑහීමකට පත්වීම සඳහා නිසි පර්යේෂණ විධි හා වාර්තා තබා ගැනීමේ ක්‍රමයක් සකස් කොට පවත්වාගෙන යාම කළ යුතු වුවත්, විශ්වවිද්‍යාලයේ එවැනි විධිමත් ක්‍රමවේදයක් පවත්වාගෙන නොයන බව නිරීක්ෂණය විය. |
| (ii) 6.5 වගන්තිය | අතිකාල ගෙවීමේදී පැයකින් හතරෙන් පංගුවකට අඩු කොටසක් ගණන් නොගත යුතු වුවත් නිලධාරීන් 5 දෙනෙකුට අවස්ථා 68 කදී පැයකින් හතරෙන් පංගුවකට අඩු කොටසක් සඳහා රු. 3,299ක් ගෙවා තිබුණු බව නිලධාරීන් 15 දෙනෙකුගෙන් සමන්විත නියැදියක් පරීක්ෂාවේදී අනාවරණය විය. |
| (iii) 2.1 හා 2.2 වගන්ති | අතිකාල දීමනා ගෙවිය හැක්කේ නිශ්චිත වශයෙන් නියම කරන ලද්දා වූද, සාමාන්‍ය රාජකාරීවලදී ඒකාන්තයෙන් පරිබාහිර වූද, හදිසි වූද, වැඩ සඳහා පමණක් වුවත් නිලධාරීන් 15 දෙනෙකුගෙන් සමන්විත නියැදියක් පරීක්ෂාවේදී එයින් නිලධාරීන් 06 දෙනෙකු සති අන්ත දිනයන්හි අතිකාල සේවයේ යෙදී සඳුදා දින නිවාඩු ලබා ගෙන තිබුණු අවස්ථා 10 ක්ද, නිලධාරීන් 03 දෙනෙකු සිකුරාදා දින නිවාඩු ලබා ගැනීම් අවස්ථා 03 ක් ද නිරීක්ෂණය විය. |
| (iv) XXVI පරිච්ඡේදයේ 2.1 ඡේදය | මුදල් වර්ෂය අවසාන දිනට ආයතනයට අයත් සියලුම භාණ්ඩ සහ ස්ථාවර වත්කම්, අදාළ කාර්යය සඳහා පත් කරනු ලබන සමීක්ෂණ මණ්ඩලයක් විසින් හරි වැරදි බැලිය යුතු වුවත්, 2005 වර්ෂයෙන් පසුව විශ්වවිද්‍යාලයේ පුස්තකාල පොත් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය**

**-------------------------------------**

| | |
|---|---|
| **(i)** 3.7. සහ 3.8 ඡේද | සේවකයන්ගෙන් ණය වාරික අඛණ්ඩව සහ මාසිකව අයකර ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ අවස්ථා 03 කදී එසේ නියමිත කාලය තුළ හා අඛණ්ඩව අයකර නොගත් ණය වාරිකවල වටිනාකම රු. 306,655 ක් විය. |
| (ii) 3.18. ඡේදය | ණය මුදල් අයකර ගැනීමට හෝ අයකර ගැනීමේ සතුටුදායක වැඩ පිළිවෙලක් යෙදීමට හෝ කටයුතු නොකර රු. 1,841,820 ක ආපදා ණය ශේෂයක් සහිත නිලධාරීන් 20 දෙනෙකුට වැටුප් රහිත නිවාඩු ලබා දී තිබුණි. |

(ඇ) **2015 ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය**

**-------------------------------------**

තත්කාර්ය අත්තිකාරම් උපරිම සීමාව වන රු. 100,000 ඉක්මවා නිලධාරීන් 11 දෙනෙකුට අවස්ථා 14 කදී රු. 2,632,831 ක අත්තිකාරම් ලබාදී තිබුණි. තවද, මාණ්ඩලික නිලධාරීන්ට පමණක් තත්කාර්ය අත්තිකාරම් නිකුත් කිරීම වෙනුවට මාණ්ඩලික නොවන තනතුරුවල නිලධාරීන්ටද අත්තිකාරම් නිකුත් කර තිබුණි.

තත්කාර්ය අත්තිකාරම් ලබාගත් නිලධාරියකු අදාළ කාර්යය නිමකල විගස හෝ දින 10 ක් ඇතුළත එම අත්තිකාරම් පියවිය යුතු වුවද රු. 972,425 ක් වූ අත්තිකාරම් 25 ක් දින 13 සිට දින 58 දක්වා කාල පරාසයක් ප්‍රමාද වී පියවා තිබුණි. තවද අග්‍රිම, එය නිකුත් කරන මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට පෙර පියවිය යුතු වුවත් 2016 දෙසැම්බර් 31 දිනට රු. 402,920 ක් වටිනා අත්තිකාරම් 07ක් පියවා නොතිබුණි.

| | |
|---|---|
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග සම්බන්ධයෙන්, චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

**(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ**

**-------------------------------------**

| | |
|---|---|
| (i) 2002 මැයි 16 දිනැති අංක 803 දරන චක්‍රලේඛය සහ කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ඩීඑම්එස්/7777/ටීඩීපී/එස්ජේපී හා 2014 සැප්තැම්බර් 16 දිනැති ලිපිය | විශ්වවිද්‍යාලයේ නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලයට, ව්‍යාපෘති කළමනාකරු, ව්‍යාපෘති පරිපාලන නිලධාරී, ප්‍රමාණ සමීක්ෂක සහ තාක්ෂණ නිලධාරී යන තනතුරු සඳහා බඳවා ගැනීමේ දී නියමිත ක්‍රමවේදයන් අනුගමනය කර නොතිබුණි. |

(ii) 2002 ජූලි 22 දිනැති අංක 806 දරන චක්‍රලේඛය

(i) වෙනත් විශ්වවිද්‍යාලයක සප්ත වාර්ෂික නිවාඩු ලබා පැමිණෙන නිලධාරීන් අදාළ තනතුරට පමණක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සිදු කළ යුතු වුවත් ඊට පටහැනිව අවස්ථා 2 කදී ඉහළ තනතුරු දෙකක් සඳහා පහළ තනතුරු දෙකක නිලධාරීන් බඳවා ගැනීම් සිදුකර තිබුණි.

(ii) සප්ත වාර්ෂික නිවාඩු කාලය තුළ වෙනත් විශ්වවිද්‍යාලයක සමාන තනතුරක ඇති වන පුරප්පාඩු ආවරණය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත පත්කිරීම් සිදු කළ හැකි වන්නේ එම තනතුරේ සේවය කළ නිලධාරියා වැටුප් රහිත නිවාඩු ලබා සිටීනම් පමණක් වුවත් හිටපු මූල්‍යාධිකාරීගේ වැටුප් සහිත සප්ත වාර්ෂික නිවාඩු කාලය තුළම සප්ත වාර්ෂික නිවාඩු ලබා තිබුණු කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරිවරිය මෙම විශ්වවිද්‍යාලයේ මූල්‍යාධිකාරි ලෙස පත්කර තිබුණි. ඒ අනුව එකම කාලපරිච්ඡේදයක් සඳහා මූල්‍යාධිකාරි තනතුර වෙනුවෙන් පිළිවෙලින් රු. 2,328,598 ක් සහ රු. 1,731,280 ක් ස්ථිර සහ තාවකාලික නිලධාරීන් දෙදෙනෙකුට ගෙවා තිබුණි.

(iii) 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන චක්‍රලේඛය
--------------------------------

8.4.2 වගන්තිය

විශ්වවිද්‍යාලය විසින් පවත්වනු ලබන ස්වයං මූල්‍ය පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතු වුවත්, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ පාඨමාලා 04 ක්, කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨයේ පාඨමාලා 05 ක්, සහ පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයේ පාඨමාලා 15ක් සඳහා එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

5.1.6 වගන්තිය

ඍජු පිරිවැය අඩුකළ, ස්වයං මූල්‍ය පාඨමාලා ආදායමෙන් සියයට 0.01 ක ප්‍රතිශතයක් විශ්වවිද්‍යාලයේ මූල්‍ය ක්‍රියාකාරී වැය විෂයය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට මාරු කළ යුතු වුවත් එසේ මාරු කර නොතිබුණි.

5.5 වගන්තිය

චක්‍රලේඛයේ ආකෘති අංක 1 ප්‍රකාරව ස්වයං මූල්‍ය පාඨමාලා ආදායම් වියදම් ගිණුම් පිළියෙල කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය
**----------------------**

### 3.1 මූල්‍ය ප්‍රතිඵල
**--------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.156,499,651 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.17,883,619 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 138,616,032 කින් පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂයේ රජයේ පුනරාවර්තන ප්‍රදාන ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 238,159,842 කින් වැඩිවී තිබුණද, අභ්‍යන්තර ආදායම රු. 16,019,106 කින් අඩුවීමත්, වැටුප් හා දීමනා සහ පාරිතෝෂික වෙන් කිරීම් රු. 243,468,389 කින්, ගිවිසුම්ගත සේවා සහ නඩත්තු වියදම් රු.102,555,787 කින් සහ ගමන් වියදම් රු. 18,527,675 කින් වැඩිවීමත්, ඉහත පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2012 වර්ෂයේ සිට අඛණ්ඩව පිරිහෙන ඌනතාවයක් නිරීක්ෂණය වූ අතර 2012 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය වන විට එම පිරිහීම රු. 51,493,938 ක් වී තිබුණි. කෙසේ වුවද මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ රු. 1,254,759,552 ක ධන අගයක් වූ දායකත්වය 2016 වර්ෂය වන විට රු. 2,394,246,291 දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

2014 වර්ෂයේ රු. මිලියන 9.97 ක් වූ ගමන් වියදම් 2015 වර්ෂයේ රු. මිලියන 27.59 ක් දක්වා රු. මිලියන 17.62 කින් වැඩිවී තිබුණු අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී එය රු.මිලියන 46.12 දක්වා සියයට 67 කින් තවදුරටත් වැඩිවී තිබුණි. 2014 වර්ෂයේ රු.මිලියන 6.09 ක් වූ විදේශ ගමන් වියදම සමාලෝචිත වර්ෂය වනවිට රු.මිලියන 41.31 ක් දක්වා සියයට 578 කින් වූ වැඩිවී තිබුණු අතර එය සමස්ත ගමන් වියදම් ප්‍රමාණයෙන් සියයට 89.56 ක් බව නිරීක්ෂණය විය.

## 3.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය ධුරයෙන් ඉවත් කිරීමට එරෙහිව හිටපු කථිකාචාර්යවරයකු විසින් දිසා අධිකරණයේ සහ සේවයෙන් පහකිරීමට එරෙහිව සේවකයන් දෙදෙනෙකු හා සේවා දිගුව ලබා නොදීමට එරෙහිව එක් සේවකයෙකු විසින් කම්කරු විනිශ්චය සභාවේ නඩු 03 ක් විශ්වවිද්‍යාලයට එරෙහිව පවරා තිබුණි.

(ආ) ඇප බැඳුම්කර කඩ කිරීම හේතුවෙන් අයවිය යුතු රු. 5,103,826 ක් අයකර ගැනීම සඳහා විශ්වවිද්‍යාලය විසින් හිටපු කථිකාචාර්යවරයකුට එරෙහිව ගංගොඩවිල දිසා අධිකරණයේ නඩුවක් පවරා තිබුණි.

# 4. මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ඉංජිනේරු පීඨය, තාක්ෂණ පීඨය, බාහිර විභාග අංශය සහ පශ්චාත් උපාධි පීඨය හැර විශ්වවිද්‍යාලයේ අනෙකුත් පීඨ 4හි අධ්‍යාපනය ලැබූ ශිෂ්‍යයින් 11,609 දෙනෙකු වෙනුවෙන් පුනරාවර්තන වියදම ලෙස රු. 2,896,912,408 ක් වැයකර තිබුණු අතර, ඊට අනුරූපීව පසුගිය වර්ෂයේ ශිෂ්‍යයින් 11,568 දෙනෙකු වෙනුවෙන් රු. 2,526,314,151 ක් වැය කර තිබුණි. අදාළ වියදම් පීඨ අනුව බෙදා හැරීමෙන් පසුව ගණනය කරන ලද ඒක ශිෂ්‍ය පිරිවැය පහත දැක්වෙන අතර, ඒ අනුව සාමාන්‍ය ඒක ශිෂ්‍ය පිරිවැය රු. 32,617 කින් හෙවත් සියයට 14 කින් වැඩිවී තිබුණි.

| පීඨය | ඒක ශිෂ්‍ය පිරිවැය | |
|---|---|---|
| | 2016 (රු) | 2015 (රු) |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | **314,288** | **271,122** |
| මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය | **216,341** | **181,542** |
| කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨය | **185,827** | **160,194** |
| වෛද්‍ය විද්‍යා පීඨය | **542,176** | **497,261** |
| සාමාන්‍ය ඒක ශිෂ්‍ය පිරිවැය | **251,005** | **218,388** |

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ විශ්වවිද්‍යාලය පවත්වා ගෙන ගිය වාර්තාවල තොරතුරුවලට අනුව පසුගිය අධ්‍යයන වර්ෂ 3 සඳහා සිසුන් බඳවා ගැනීම පිළිබඳව විශ්ලේෂණයක් පහත දැක්වේ.

| අධ්‍යයන වර්ෂය | බඳවා ගැනීමට යෝජිත වූ ශිෂ්‍ය සංඛ්‍යාව | බඳවාගත් ශිෂ්‍ය සංඛ්‍යාව | | |
|---|---|---|---|---|
| | | විශ්වවිද්‍යාලයට අනුව | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම අනුව | වෙනස |
| 2013/2014 | 2,750 | 2,886 | 2,937 | (51) |
| 2014/2015 | 2,800 | 2,915 | 2,990 | (75) |
| 2015/2016 | 3,260 | 3,271 | 3,213 | 58 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2015/2016 අධ්‍යයන වර්ෂයට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමෙහි දැක්වෙන සංඛ්‍යාවට වඩා වැඩි සිසුන් ප්‍රමාණයක් ද ඉන් පෙර අධ්‍යයන වර්ෂ සඳහා අඩු ප්‍රමාණයක්ද බඳවා ගෙන ඇති බව නිරීක්ෂණය විය. සිසුන් බඳවා ගැනීම් පිළිබඳ තීරණ ගැනීමේදී මෙම ආයතන දෙකෙහි තොරතුරු නිවැරදිව පවත්වා නොගැනීම අහිතකර ලෙස බලපා තිබුණි.

(ii) විශ්වවිද්‍යාලයේ පීඨ අනුව සලකා බැලීමේදී ඒ ඒ පීඨ සඳහා පසුගිය අධ්‍යයන වර්ෂ 3 ඇතුළත බඳවා ගැනීමට ඉඩ ප්‍රස්ථා තිබුණු නමුත් බඳවා නොගත් ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| අධ්‍යයන වර්ෂය | බඳවා නොගත් ශිෂ්‍ය සංඛ්‍යාව | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | වෛද්‍ය පීඨය | ව්‍යවහාරික විද්‍යා පීඨය | කළමනාකරණ අධ්‍යයන පීඨය | මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | |
| 2013/2014 | 18 | - | - | - | 18 |
| 2014/2015 | 13 | 222 | 06 | - | 241 |
| 2015/2016 | 01 | 51 | 05 | 07 | 64 |
| **එකතුව** | **32** | **273** | **11** | **07** | **323** |

මෙම බඳවා නොගත් ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සියයට 94 කට අධික ප්‍රමාණයක් වෛද්‍ය විද්‍යා සහ විද්‍යා විෂය ධාරාවන්ට අයත් බවත්, විශ්වවිද්‍යාලයේ ප්‍රමාණවත් ඉඩකඩ පැවතියදීත් සිසුන් 323 දෙනෙකු බඳවා නොගැනීම තුළින් ආර්ථික සහ සමාජීය අවාසියක් සිදුව තිබුණු බවත් නිරීක්ෂණය විය.

(ඇ) විශ්වවිද්‍යාලයක් විසින් සිදුකරන පර්යේෂණවලින් එම විශ්වවිද්‍යාලයේ තත්ත්වය ඉහළ නැංවෙන අතර ජාතික ආර්ථිකයටද විශාල දායකත්වයක් සපයනු ලැබේ. එබැවින් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට පර්යේෂණාධාර ලබාදීම සඳහා රජය විසින් විශාල ප්‍රතිපාදන ප්‍රමාණයක් වාර්ෂිකව වෙන් කරන අතර සමාලෝචිත වර්ෂයේදී පර්යේෂණ දීමනා වශයෙන් රු.මිලියන 97.03 ක්ද ඇතුළුව රු. මිලියන 172.78 ක් ඒ සඳහා වැය කර තිබුණි. එසේ වුවද, අදාළ ප්‍රතිපාදනවලින් විවිධ පර්යේෂණ යෝජනා සඳහා පර්යේෂණාධාර ලබාදීමට විශ්වවිද්‍යාලය අනුගමනය කරන ක්‍රමවේදය සහ පර්යේෂණ ප්‍රගතිය, අසතුටුදායක තත්ත්වයක පවතින බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය විය.

(i) 2007 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කථිකාචාර්යවරු 90 දෙනෙකු පර්යේෂණාධාර ලබා ගෙන තිබුණු නමුත් 2017 අප්‍රේල් මාසය දක්වාම අදාළ පර්යේෂණ සම්බන්ධයෙන් අවසන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2012 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුළ පර්යේෂණ යෝජනා ඉදිරිපත් කළ කථිකාචාර්යවරු 18 දෙනෙකු වෙනුවෙන් විශ්වවිද්‍යාලය විසින් රු. 13,790,181 ක් වෙන්කර තිබුණු අතර ඉන් රු.10,288,614 ක් පර්යේෂණාධාර ලෙස අදාළ කථිකාචාර්යවරුන් විසින් ලබා ගෙන තිබුණි. එහෙත් 2017 මාර්තු 31 දින වන විටද යථෝක්ත කථිකාචාර්යවරුන් පර්යේෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණු අතර මෙම කාල ප්‍රමාදය මාස 01 සිට මාස 25 ක් දක්වා වූ පරාසයක පැවතුණි.

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2016 මාර්තු 18 දිනැති ලිපිය අනුව, සමාලෝචිත වර්ෂය තුළ ජාතික වශයෙන් වැදගත් වන්නා වූ අංශ 5 ක් යටතේ පර්යේෂණයන් සිදුකිරීම සඳහා රු. මිලියන 60ක් වෙන්කර දී තිබුණි. එයින් රු.මිලියන 10 ක් වකුගඩු රෝගය සම්බන්ධ පර්යේෂණ කටයුතු ආරම්භ කිරීමට වෙන්කර තිබුණද අදාළ පර්යේෂණ කටයුතු සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම ආරම්භ කර නොතිබුණි.

(iv) පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව විසින් ප්‍රදානය කර තිබුණු පර්යේෂණාධාර ලබා දීමේ ලිපියේ කොන්දේසි අනුව, පර්යේෂණ කටයුතු ආරම්භ කළ දිනය හෝ ආරම්භ කරන දිනය නියෝජ්‍ය ලේඛකාධිකාරී හරහා අධ්‍යයන ශිෂ්‍ය කටයුතු හා ප්‍රකාශන අංශය වෙත දැනුම් දිය යුතු වුවත් රු. 2,905,995 ක ප්‍රතිපාදන ලබා ගත් කථිකාචාර්යවරුන් 13 දෙනෙකු එසේ ආරම්භක දිනය දැනුම් දී නොතිබූ බැවින් වාර්තාවල කාල පමාවන් නිසි පරිදි හඳුනාගැනීමට නොහැකිව පැවතුණි.

(v) පර්යේෂණාධාර ගෙවීම් පිළිබඳ සම්පූර්ණ තොරතුරු අනාවරණය කර ගත හැකි පරිදි අදාළ අංශ විසින් පර්යේෂණාධාර ලිපිගොනු යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(vi) පර්යේෂණාධාර ලබාගත් කථිකාචාර්යවරුන් පර්යේෂණ යෝජනා නියමිත දිනට ලබා නොදීම, පර්යේෂණ වාර්තා ඉදිරිපත් නොකිරීම හා ප්‍රගති වාර්තා කාලීනව ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සත්‍ය වශයෙන්ම පර්යේෂණ සිදු කර ඇත්ද යන්න හා ප්‍රමාද වී ලබා දෙන පර්යේෂණ වාර්තා කොතරම් ඵලදායී ද යන්න ගැටළු සහගත වන අතර පර්යේෂණාධාර ප්‍රතිපාදනයෙන් අපේක්ෂිත අරමුණු ඉටුවීද යන්න සම්බන්ධයෙන් විගණනයේදී ගැටළු සහගත විය.

(ඇ) ලොවපුරා පවතින විශ්වවිද්‍යාල අතර දේශීය විශ්වවිද්‍යාල ඉහළ ස්ථානයකට රැගෙන ඒමේ අරමුණ ඇතිව 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ විශේෂ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂය දක්වා රු.මිලියන 125.38 ක ප්‍රතිපාදන ලබාදී තිබූ අතර එයින් රු.මිලියන 120.98 ක් වැය කර තිබුණි. එසේ වුවද ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම් අනුව ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට හිමිව තිබුණු තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | හිමිවූ ශ්‍රේණිය |
|---|---|
| 2012 | 2758 |
| 2013 | 5869 |
| 2014 | 3090 |
| 2015 | 4282 |
| 2016 | 3752 |

මෙම වර්ගීකරණය අනුව විශ්වවිද්‍යාලය සතුටුදායක තත්ත්වයක නොපවතින නිරීක්ෂණය වූ අතර 2011 වර්ෂයේ සිට ක්‍රියාත්මක කළ විශේෂ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ නිරීක්ෂණ පහත දැක්වේ.

(i) ලෝක විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම්වලදී පර්යේෂණ සහ උපුටා ගැනීම් වෙනුවෙන් සියයට 60ක ලකුණු ප්‍රමාණයක් ලබා දෙන බැවින් එම ඉලක්කය සපුරා ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ පර්යේෂණවල කාර්ය සාධනය ඉහළ නැංවීමට කටයුතු කළ යුතු වුවද ව්‍යාපෘතිය විසින් ඒ සඳහා ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(ii) පර්යේෂණ ප්‍රවර්ධනය සඳහා පොදු විද්‍යාගාර පහසුකම් සැලසීමේ අරමුණ ඇතිව විද්‍යාගාර උපකරණ ලබාගැනීම සහ ගොඩනැගිලි ඉඩ පහසුකම් වෙන්කර ගැනීම සඳහා ඉකුත් වර්ෂයේ රු. 495,664 ක් වියදම් දරා තිබුණද පසුව එම කාර්යය අත්හැර දමා තිබුණි.

(ඉ) 2016 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 23,976,680 ක් වටිනා පර්යේෂණ ප්‍රදාන ව්‍යාපෘති 40 ක් අක්‍රියව පැවති බව නිරීක්ෂණය විය.

(ඊ) විශ්වවිද්‍යාලය සතුව නේවාසිකාගාර 15 ක්ද, බදු කුලී පදනම මත ලබා ගෙන ඇති නේවාසිකාගාර 27 ක්ද, වශයෙන් නේවාසිකාගාර 42 ක් පවතින අතර එම සියළුම නේවාසිකාගාර සඳහා රාත්‍රී 8 සිට පසුදා උදෑසන 8 දක්වා අන්තර්ජාල පහසුකම් ලබාදීමටත් එම කාර්යය 2015 වර්ෂයේදී අවසන් කිරීමටත් සැලසුම් කර තිබුණද 2017 මැයි 31 දින වන විටත් නේවාසිකාගාර 2 කට පමණක් අන්තර්ජාල පහසුකම් ලබා දී තිබුණි.

(උ) ව්‍යවහාරික විද්‍යා පීඨය, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, කළමනාකරණ හා වාණිජ විද්‍යා පීඨය සහ වෛද්‍ය විද්‍යා පීඨය විසින් නව උපාධි පාඨමාලා 9 ක්ද, පශ්චාත් උපාධියක්ද, ඩිප්ලෝමා පාඨමාලා සහ සහතික පත්‍ර පාඨමාලා 16ක්ද, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය විසින් නව පශ්චාත් උපාධි 7 ක් සහ පශ්චාත් උපාධි ඩිප්ලෝමා 5 ක්ද ආරම්භ කර පවත්වාගෙන යාමට සැලසුම් කර තිබුණද 2017 මැයි 31 දින වන විටත් එම පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඖ) විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2016 වර්ෂය අවසාන වන විට රු. මිලියන 436 ක් වැයකර වෙළඳ සාප්පු සංකීර්ණයක්, පවුල් පුහුණු මධ්‍යස්ථානයක්, ඩෙංගු පර්යේෂණ මධ්‍යස්ථානයක් සහ ශ්‍රවනාගාරයක් ඉදිකිරීම සඳහා සැලසුම්කර තිබුණද 2017 මැයි මස 31 දින වන විටත් වැඩ ආරම්භ කර නොතිබුණි.

( ඵ) ව්‍යවහාරික විද්‍යා පීඨයේ උද්භිද විද්‍යා අධ්‍යයනාංශය විසින් පැල නිෂ්පාදන මධ්‍යස්ථානයක්ද ආහාර විද්‍යා හා තාක්ෂණ අධ්‍යයනාංශය මගින් ආහාර තාක්ෂණය සහ විශ්ලේෂණ ඒකකයක්ද 2015 වර්ෂය වන විට ස්ථාපිත කළ යුතු වුවත් 2017 මැයි 31 වන විටත් ඒවා ආරම්භ කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ වැටුප් පිළියෙල කරන මෘදුකාංගයේ පැවති අඩුපාඩු හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී කාර්ය මණ්ඩලයට ගෙවන ලද සේවක පාරිශ්‍රමිකවල නිරවද්‍යතාව පිළිබඳව ගැටළු මතුවී තිබුණි. ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන නිරීක්ෂණවලට අනුව, දැනට භාවිතා කරන විශ්වවිද්‍යාලයේ පරිගණක අංශය විසින් සකස් කළ අර්ධ ස්වයංක්‍රීය මෘදුකාංගය සහිත වැටුප් පැකේජයෙහි පවතින අඩුපාඩුකම් ඉවත් කර එම ක්‍රමය යාවත්කාලීන කිරීමටත්, ඒ සඳහා පද්ධති විගණනයක් සිදු කොට මාස 06 ක් හෝ ඊට අඩු කාලයක් තුළදී මෘදුකාංගය තත්ත්වයෙන් උසස් කිරීමටත්, හැකි ඉක්මනින් සමස්ත ගිණුම් ක්‍රමයෙහිම ගුණාත්මක සහ විශ්වාසනීයත්වය උසස් කරලන පරිදි නව පරිගණක ක්‍රමයක් හඳුන්වාදීමටත්, කටයුතු කිරීමට 2017 අගෝස්තු මස 10 දින පැවති 466 වැනි පාලක සභාව තීරණය කර තිබුණි.

(ආ) මුදල් ලැබීම් හා එම ලැබීම්වලට අදාළ කාල නිර්ණය නිවැරදිව තක්සේරු කිරීමකින් තොරව වියදම් දැරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි මාසයේ සිට දෙසැම්බර් දක්වා දෛනිකව රු. 7,221,447 සිට රු. 80,855,247 ක් දක්වා මුදල් පොතේ ඍණ ශේෂ උද්ගතව තිබුණි.

(ඇ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 114 වන වගන්තිය ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් විසින් එක් එක් තක්සේරු වර්ෂ සඳහා නිශ්චිතව දක්වන බදු වක්‍ර අනුව උපයන විට ගෙවීම් බදු අය කිරීම් පිළිබඳ පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) වෙනත් විශ්වවිද්‍යාලවලින් සප්ත වාර්ෂික නිවාඩු ලබා පැමිණෙන නිලධාරීන් සේවයේ යොදවා ගැනීමේදී ඔවුන්ගේ පාරිශ්‍රමිකවලින් උපයන විට ගෙවීම් බදු අඩුකිරීම සඳහා නියමිත බදු වක්‍රය උපයෝගී කර නොගැනීම හේතුවෙන් නිලධාරීන් 6 දෙනෙකුගේ පාරිශ්‍රමිකවලින් රු. 330,110 ක් අඩුවෙන් බදු අයකර ගෙන තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ විවිධ පීඨ සඳහා බාහිර කථිකාචාර්යවරුන් 205 දෙනෙකුගේ සේවය ලබාගෙන තිබුණු අතර ගිවිසුම්ගත පාරිශ්‍රමික එකතුව රු. 37,153,200 කට අධික බව නිරීක්ෂණය විය. එසේ වුවද, ඔවුන්ගේ ස්ථිර සේවා ස්ථාන පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමට විධිමත් ක්‍රමවේදයක් නොතිබුණු අතර තොරතුරු ඉදිරිපත් කළ අයගෙන් පමණක් ද්විත්ව සේවා නියුක්තිය යටතේ උපයන විට ගෙවීම් බදු අයකර ගෙන තිබුණි.

(ඇ) සේවක සුභ සාධනය අරමුණු කර ගනිමින් රු. 1,032,118 ක ආරම්භක වියදමක් දරා 2014 වර්ෂයේ ආරම්භ කර තිබූ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ පූර්ව ළමාවිය දරුවන් සඳහා වූ දිවා සුරැකුම් මධ්‍යස්ථානය සහ පෙර පාසලේ පරිපාලන කටයුතු සඳහා ව්‍යවස්ථා මාලාවක් අනුමත කර ගෙන තිබුණි. එසේ වුවද,එම ව්‍යවස්ථාව ප්‍රකාරව, කටයුතු කර නොතිබූ අතර කළමනාකරණ මණ්ඩල රැස්වීම් සහ විධායක සභා රැස්වීම් නිසි පරිදි නොපැවැත්වීම, ගාස්තු අයකිරීම්, ආදායම් වියදම් ගිණුම් පිළියෙල කිරීම, එම ගිණුම් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කිරීම හා විගණනය නිසි පරිදි සිදුකර නොතිබුණි. තවද විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය කටයුතු සඳහා භාවිතා කරන සම්පත් දිවා සුරැකුම් මධ්‍යස්ථානය සඳහාද භාවිතා කර තිබූ නමුත් ඒ පිළිබඳ ක්‍රමානුකූල වාර්තා කරණයක් සිදුකර නොතිබීම, කාර්ය මණ්ඩල බඳවා ගැනීම හා පුහුණු කිරීම සහ පාලනය සම්බන්ධයෙන් නිශ්චිත ප්‍රමිතියක් නොමැතිවීම ආදී කළමනාකරණ දුර්වලතා රාශියක් පැවති බවද නිරීක්ෂණය විය.

(ඉ) විශ්වවිද්‍යාලයේ විවිධ කාර්යයන් සඳහා ලබා ගත් අත්තිකාරම් නියමිත කාර්යය සඳහා යොදා නොගැනීම හේතුවෙන් අත්තිකාරම් මුදලින් සියයට 55 ත් සියයට 92 ත් අතර ප්‍රමාණයක් ඉතිරි වී අත රඳවාගෙන තිබූ අවස්ථා 9 ක් නිරීක්ෂණය විය. ඒ අනුව වියදම් හඳුනා නොගෙන අත්තිකාරම් ලබා දී ඇති බව නිරීක්ෂණය විය.

(ඊ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා සහ උසස් අධ්‍යාපන ආයතන සංග්‍රහයේ 20 වෙනි පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ X වෙනි පරිච්ඡේදයේ 1.6.1 වගන්තිය ප්‍රකාරව අධ්‍යයන සේවකයින්ගේ පැමිණීම, පිටවීම සහ නිවාඩු සනාථ කර ගැනීම සඳහා ක්‍රමවේදයක් සකස් කළ යුතු බවට 2010 සැප්තැම්බර් 07 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කමිටුවේදී උපදෙස් දී තිබුණි. එහෙත් මෙතෙක් එවැන්නක් සකස් කර නොතිබුණු බැවින්, අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ගෙවන ලද රු. 1,778,988,859 ක් වූ වැටුප් හා දීමනාවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකිවිය. අනෙකුත් රජයේ ආයතන විසින් ක්‍රියාත්මක කරන රාජකාරී සඳහා පැමිණීමේ සහ පිටවීමේ වේලාව සටහන් කිරීමේ ක්‍රම කිසිවක් විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් ක්‍රියාත්මක නොවන අතර, කථිකාචාර්යවරුන් නිසිපරිදි දේශන සඳහා සහභාගී වන බැවින් එවැනි අවශ්‍යතාවයක් නොමැති බව විගණන විමසුම්වලට පිළිතුරු වශයෙන් දක්වා තිබුණි. එසේ වුවද, කථිකාචාර්යවරුන් දේශන සඳහා පැමිණීම පිළිබඳව අධ්‍යයන අංශ කිහිපයක සිදු කරන ලද පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු අනුව ඒ සම්බන්ධයෙන් සතුටුදායක පාලන ක්‍රමයක් නොපවතින බව පහත සඳහන් කරුණු අනුව නිරීක්ෂණය විය.

(i) දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ 2014/2015 අර්ධ වර්ෂයට අදාළ කාර්යසාධනය පරීක්ෂා කිරීමේදී දේශන ප්‍රතිමාන සැලැස්ම අනුව, එක් එක් විෂයය සඳහා අර්ධ වර්ෂයක් තුළ පැවැත්විය යුතු දේශන පැය ගණනට සමානුපාතිකව කාලසටහන් පිළියෙල කර නොතිබුණු බවත් කාලසටහන්වල සඳහන් දේශන පැය ගණනට වඩා අඩු දේශන පැය ප්‍රමාණයක් පවත්වා තිබුණු බවත් නිරීක්ෂණය විය. මේ අනුව, විෂයයන් 17 කට අදාළ දේශන ප්‍රතිමාන සැලැස්ම,දේශන කාලසටහන් සහ අත්සන් ලේඛන සැසඳීමේදී දේශන පැය 176 ක් අඩුවෙන් පවත්වා තිබුණු බව නිරීක්ෂණය වූ අතර දේශනවලට නිසි පරිදි සහභාගී වූ දේශකයන් සහ එසේ නොකළ අය නිශ්චිතව හඳුනාගත හැකි ආකාරයට ලිපි ලේඛනද පවත්වා නොතිබුණු බව අනාවරණය විය.

(ii) භූගෝල විද්‍යා අධ්‍යයනාංශයේ දේශන ප්‍රතිමාන සැලැස්ම හා කාල සටහන් ඇසුරින් දේශන පැවැත්වීමේ ප්‍රගතිය පරීක්ෂාවේදී, අධ්‍යයනාංශය තුළ ස්ථිර සේවයේ නියුතු දේශකවරු 09 දෙනෙකුගෙන් 06 දෙනෙකුටම අවස්ථා 15 කදී දේශන ප්‍රතිමාන සැලැස්ම ප්‍රකාරව තනතුරු අනුව ලබා දිය යුතු අවම දේශන පැය ප්‍රමාණය ලබා දී නොතිබුණු බව අනාවරණය විය. තවද, පළමු අර්ධ වර්ෂය සඳහා පිළිවෙලින් දේශන පැය 30ක්, 06ක්, 04ක් සහ 04ක් වශයෙන් ආවරණය කළ යුතු කථිකාචාර්යවරු 4 දෙනෙකු එක් දේශනයක් හෝ පවත්වා නොතිබුණු බවද, දේශන පැවැත්වීමේ දී ස්ථිර දේශකවරුන්ට අදාළ පැය ගණන තාවකාලික දේශකවරුන්ගෙන් ආවරණය කර ගෙන

තිබූ අවස්ථාද පැවති බව නිරීක්ෂණය විය. තවද, දේශන ප්‍රතිමාන සැලැස්මෙන් ස්ථිර දේශකවරයකුට පැය 02 ක දේශන වෙන්කර තාවකාලික දේශකවරයකුට දේශන පැය 28 ක් ලබාදී තිබුණු අවස්ථා පැවති බවද නිරීක්ෂණය විය.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලය විසින් ගිවිසුම්ගත සේවා සඳහා රු.මිලියන 350.18 ක් වැය කර තිබුණු අතර ඉන් සියයට 30 ක් හෙවත් රු. මිලියන 106.37 ක් පිරිසිදු කිරීමේ සේවා පවත්වා ගැනීම සඳහා වැය කර තිබුණි. මෙම වියදම් සඳහා වැඩි දායකත්වයක් සපයා ඇති ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ සේවා සැපයුම්කරුවන් තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිවැරදිව අනුගමනය කර නොතිබුණු අතර සැපයිය යුතු සේවාවන් නිසි අධ්‍යයනයකින් තොරව මිල ගණන් කැඳවීම සහ ගිවිසුම්වලට එළැඹීම සිදුව තිබුණි. එහිදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) බැහැර කරන ලද ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය හා ගලිබවුසර ප්‍රමාණය නිසි පරිදි අධීක්ෂණය කර සටහන් නොතැබීම හේතුවෙන් පිළිවෙලින් රු. 528,846 ක් හා රු. 4,554,000 ක් ඒ සඳහා වැඩිපුර ගෙවීමට සිදුව තිබුණි.

(ii) පූතික ටැංකිවල ධාරිතාවය මිණුම් කර ඒ අනුව ගෙවීම් සිදු කිරීම, ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම් ආරක්ෂක අංශයේ සටහන් සමග සැසඳීම් කර ඒ අනුව ගෙවීම් සිදු කිරීම සහ කසල කළමණාකරණය පිළිබඳ විශ්වවිද්‍යාලය ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගුණත්වය ඉහළ නැංවීම සහ පර්යේෂණ සංවර්ධනය, අසල්වැසි ප්‍රජාවගේ පාරිසරික, සමාජීය, සංස්කෘතික, වාර්ගික සහ ආර්ථික සංවර්ධනය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමේ අරමුණින් ජාත්‍යන්තරව පිළිගත් විශ්වවිද්‍යාල නගර සංකල්පය අනුව යමින් 2013 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලසීමාව තුළ විශ්වවිද්‍යාල නගර සංවර්ධන ව්‍යාපෘති 37 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2014 ජනවාරි 14 දිනැති අංක අමාත්‍ය/13/1730/521/056 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. භාණ්ඩාගාර අරමුදල් රු. මිලියන 2057 ක් සහ වෙනත් අරමුදල් රු. මිලියන 187 ක ඇස්තමේන්තුවක් යටතේ ක්‍රියාත්මක කරමින් පැවති මෙම වැඩසටහනේ වර්තමාන තත්ත්වය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ඉකුත් වර්ෂය අවසන් වන විට ව්‍යාපෘති 37 ක් නිමකිරීමට නියමිතව තිබුණද, ඇස්තමේන්තු පිරිවැය රු. මිලියන 1,174.1 ක් වූ ව්‍යාපෘති 27 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ප්‍රසම්පාදන ක්‍රියාවලිය හෝ ආරම්භ කර නොතිබුණි.

(ii) විශ්වවිද්‍යාල නගර ව්‍යාපෘතියේ ප්‍රධාන සැලසුම සකස් කිරීම ද ඇතුළුව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ව්‍යාපෘති 6 ක් පමණක් නිම කර තිබුණු අතර රු. මිලියන 151.2 ක් ඇස්තමේන්තු පිරිවැය වූ එම ව්‍යාපාති සඳහා රු.මිලියන 157.58 ක් වැය කර තිබුණි.

(iii) සෝරත මාවත ප්‍රතිසංස්කරණය, තාප්ප සහ ගේට්ටු ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 27.4 ක් වෙන් කර තිබුණු නමුත් අදාළ ව්‍යාපෘතිය නිම කිරීම සඳහා රු. මිලියන 85.48 ක් වැය කර තිබුණි.

(iv) ඩෙංගු පර්යේෂණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සහ පර්යේෂණ උපකරණ සැපයීම සඳහා රු. මිලියන 137 ක් වෙන් කර තිබුණු නමුත් රු. මිලියන 22.78 ක් වටිනා උපකරණ සැපයීම පමණක් සිදුකර තිබුණි.

(v) වෛද්‍ය පීඨය සහ පරිපාලන සංකීර්ණය අවට වැසි ජලය බැස යාමේ කානු පද්ධතියක් ඉදිකිරීම සඳහා රු. මිලියන 10 ක් වෙන්කර තිබුණු නමුත් එය සැලසුම් කිරීම සහ ප්‍රසම්පාදන කටයුතු කිරීම සඳහා පමණක් රු. මිලියන 4.05 කටත් අධික මුදලක් වැයකර තිබුණු නමුත් ව්‍යාපෘතිය අවසන් කර නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) භාණ්ඩ තොග ශේෂය තුළ රු. 3,895,026 ක් වටිනා යල්පැනගිය හා සෙමෙන් චලනය වන ටෝනර් තොග පැවතුණි. ගබඩාව තුළ ප්‍රමාණවත් තොග ශේෂ පැවතිය දී හා භාණ්ඩ ඉල්ලුම් කිරීමකින් තොරව නැවත මිලදී ගැනීම හේතුවෙන් එම තොගය තුළ රු. 2,021,408 ක් වටිනා ටෝනර් වර්ග 19 ක්, ඉතිරිව පැවති බව නිරීක්ෂණය විය.

(ආ) වසර 05 කට වඩා පැරණි රු.191,416 ක් වටිනා තීන්ත වර්ග සහ රු.377,087 ක් වටිනා රෙදිපිළි සහ රු.73,138ක් වටිනා පරිගණක ඩිස්කට් තොග අපහරණය කිරීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සිසුන් 300 කට නේවාසිකාගාර පහසුකම් සපයා දීමේ අරමුණින් 1998 මැයි 05 දින බස්නාහිර පළාත් සභාවට රු. මිලියන1.6 ක් ගෙවා බොරලැස්ගමුවේ පිහිටි පර්චස් 41.31 ක ඉඩමක් ලබා ගෙන තිබූ අතර 2003 අගෝස්තු 06 දින කැස්බෑව ප්‍රාදේශීය ලේකම් විසින් විශ්වවිද්‍යාලය වෙත එහි භුක්තිය පවරා තිබුණි. කෙසේ වුවද, එදින සිට එම ඉඩම ඵලදායී කාර්යයක් සඳහා යොදාගෙන නොතිබූ අතර, කිසිදු සංවර්ධන කටයුත්තක් ද සිදුකර නොතිබුණි.

## 4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථිර කාර්ය මණ්ඩලයේ 481 දෙනෙකු හා කොන්ත්‍රාත් හා තාවකාලික කාර්ය මණ්ඩලයේ 34 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණු අතර ඉන් අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 217 ක් විය. විශ්වවිද්‍යාලයක මෙවැනි තත්ත්වයක් අසතුටුදායක වන අතර මෙම පුරප්පාඩු පිරවීම වෙනුවට දැනට සිටින ස්ථිර කාර්ය මණ්ඩලයේ නිලධාරීන් ගෙන් බාහිර උපදේශකයන් වශයෙන් සේවය ලබා ගැනීමට හා සප්ත වාර්ෂික නිවාඩු ලබාගැනීම මත වෙනත් විශ්වවිද්‍යාල නිලධාරීන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කර තිබුණි.

(ආ) කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමේ දී පරිගණක තාක්ෂණ උපදේශන හා පරිගණක වැඩසටහන්කරු තනතුරු සඳහා ස්ථිර හා තාවකාලික වශයෙන් බඳවා ගැනීම් සිදුකළද ස්ථිර හා තාවකාලික තනතුරු සංඛ්‍යාව නිශ්චිතව හඳුනා නොගෙන ඒකාබද්ධ කළ තනතුරු සංඛ්‍යාවක් ලෙස අනුමත කර ගෙන තිබුණි.

**4.6 වාහන උපයෝජනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලය සතුව වෙන් කළ වාහන 11ක්ද සංචිත වාහන 30 ක්ද පැවති අතර ඉන් වාහන 5 ක් ගර්හිත තත්ත්වයේ පැවතුණි. නිලධාරීන්ට වෙන් කළ වාහන හැර අනෙකුත් සියළු වාහන සංචිතයට ඇතුළත් කර විධිමත්ව පාලනය කිරීමට කටයුතු කළ යුතු වුව ද ඇතැම් වාහන විධිමත් අධීක්ෂණයකින් තොරව අධ්‍යයන අංශවල කටයුතු සඳහා යොදවා ගෙන තිබුණි.

(ආ) විශ්වවිද්‍යාලයේ වෙන් කළ වාහන භාවිතා කිරීම සඳහා හිමිකම් ලබන නිලධාරීන් 11 දෙනෙකුට මෝටර් රථ 10 ක් හා ජීප් රථයක් වෙන් කර දී තිබුණු අතර අනුමත ඉන්ධන සීමාව තුළ රු. 2,300,640 ක් වටිනා ඉන්ධනද සපයා තිබුණි. උපකුලපතිවරයා හැර අනෙක් නිලධාරීන් 10 දෙනාගේ රාජකාරී ස්වභාවය අනුව දුර බැහැර රාජකාරී ගමන් අඩු නමුත් පෞද්ගලික ගමන් බිමන් සඳහා පාලනයකින් තොරව නිලවාහනය භාවිතා කිරීමත්, ඉන්ධන පරිභෝජනය අධික වාහන ලබා දී තිබීමත්, හේතුවෙන් වර්ෂයේ අතිරේක ඉන්ධන සඳහා ඉහත ඉන්ධන සීමාවට අමතරව රු. 1,728,920 ක් වැය කිරීමට සිදුව තිබුණි. තවද අතිරේක ඉන්ධන සඳහා අනුමැතිය ලබා ගැනීමේදී ඒ ඒ රාජකාරී ගමන් සම්බන්ධයෙන් වෙන වෙනම විස්තර සහිතව අදාළ නිලධාරියා විසින්ම පාලන අධිකාරයට තොරතුරු වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණු අතර මාසිකව අනුමත සීමාව ඉක්මවන සියළුම ඉන්ධන වියදම් ප්‍රවාහන අංශය භාර නිලධාරියා විසින් පාලක සභාවේ අනුමැතියට ඉදිරිපත් කර තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

අභ්‍යන්තර විගණන අංශය සඳහා ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් අනුයුක්ත කර නොතිබුණු අතර නියෝජ්‍ය අභ්‍යන්තර විගණක හා ලිපිකරු ශ්‍රේණියේ නිලධාරීන් තිදෙනෙකුගෙන් පමණක් කාර්ය මණ්ඩලය සමන්විත විය. එසේම විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ගෙවීමේදී අදාළ ලිපිගොනු සම්බන්ධයෙන් පූර්ව විගණන කටයුතු සහ විගණකාධිපතිගේ විගණන විමසුම්වලට පිළිතුරු සැපයීමේ කාර්යයන්ද සිදුකරන බැවින් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට නොහැකි වී තිබුණි.

**5.2 ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර තිබුණු නමුත් ප්‍රසම්පාදන කාලසීමාව පිළිබඳව ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීමේදී වර්ෂය ආරම්භයේ පිළියෙල කරන ප්‍රසම්පාදන සැලසුමට අනුව කටයුතු නොකිරීම හේතුවෙන් රු. 97,033,847 ක් වූ මිලදී ගැනීම් 50 ක් 2016 දෙසැම්බර් 30 දින සිදුකර තිබුණි.

(ඇ) අවශ්‍යතාව හා ප්‍රමුඛතාව පිළිබඳ සැලකිලිමත් වීමකින් තොරව වර්ෂය අවසානයේ ඉතිරිවන මුදල් පිළිබඳ පමණක් අවධානය යොමු කර පුනරාවර්තන ස්වභාවයේ වත්කම් මිලදී ගැනීම් 43 ක් 2016 දෙසැම්බර් 30 දින සිදුකර තිබුණු අතර ඒ සඳහා රු. 15,806,053 ක් වැය කර තිබුණි.

## 5.3 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 102 වගන්තියට පටහැනිව මූල්‍ය වගකීම් ඇතිවීමෙන් පසුව එම වටිනාකම්වලට සමානුපාතිකව අයවැය ඇස්තමේන්තුව පිළියෙල කර තිබූ බැවින් සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 16 කදී වරින්වර අයවැය ලේඛනය සංශෝධනය කර තිබුණි.

## 5.4 නොවිසඳී ඇති විගණන ඡේද

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෛද්‍ය පීඨය සඳහා මෙත් සෙවන ඉඩමෙන් අක්කර 5 ක බිම් ප්‍රමාණයක් පවරා ගැනීම වෙනුවෙන් 1994 ජුනි 29 දින ගෙන තිබුණු අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 1998 වර්ෂය සිට 2010 වර්ෂය දක්වා අවස්ථා 3 කදී රු. මිලියන 24 ක්ද, සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 50 ක්ද වශයෙන් රු. මිලියන 74 ක් බස්නාහිර පළාත් සභාවට ගෙවා තිබුණද, අදාළ ඉඩම පවරා ගැනීමේ කටයුතු 2017 අගෝස්තු 31 දක්වාම සිදුකර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයෙහි රු. මිලියන 61.5 ක් වැය කර මිලදී ගෙන තිබුණු කොහුවල ඉඩම හා ගොඩනැගිල්ල විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවයට නොගැලපෙන හෙයින් කැළණිය විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය අධ්‍යයන ආයතනය වෙත පවරා දී තිබූ නමුත් මෙම පැවරීම ගිණුම්ගත කර නොතිබුණු අතර, විශ්වවිද්‍යාලය භාවිතා නොකරන වත්කමක් මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත්ව තිබුණි.

(ඇ) පිරිවැය රු. මිලියන 70 ක් වූ විශ්වවිද්‍යාලයේ අපජලය බැහැර කිරීමේ ව්‍යාපෘතියක් සඳහා 2003 අගෝස්තු 6 වැනි දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන එහි ඉදිකිරීම් සැලසුම් කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය වෙත රු. 2,336,090 ක් ගෙවා තිබුණි. ඉදිකිරීම් ආරම්භ නොකිරීම සම්බන්ධයෙන් 2011 වර්ෂයේදී විගණකාධිපති වාර්තාවෙන් සිදු කළ විමසීමේ දී අදාළ ව්‍යාපෘතිය නවතා දැමීමට තීරණය කර ඇති බව පිළිතුරු වශයෙන් දක්වා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලද කෙරීගෙන යන වැඩ යටතේ එම ශේෂය දක්වා තිබුණි.

(ඈ) 1990 වර්ෂයේ සිට ගිණුම්වල අත්තිකාරමක් ලෙස ඉදිරියට ගෙන එන ලද රු.1,310,000ක් මහරගම නගර සභාව වෙත ගෙවා ඇති බව සඳහන් කර ඇති නමුත් එම අත්තිකාරම නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේ ද කටයුතු කර නොතිබුණි.

(ඉ) රජයේ හෝ රජයේ අනුබද්ධිත ආයතනවල සේවය සඳහා වැටුප් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත 2009 වර්ෂයේදී ආරක්ෂක අමාත්‍යාංශයට මුදාහැර තිබුණු කථිකාචාර්යවරියකට ගෙවන ලද වැටුප් තුළ ඇතුළත් රු. 1,437,882 ක අධ්‍යයන දීමනා අදාළ ආයතනය වෙතින් ප්‍රතිපූරණය කළ නොහැකි බව දන්වා ඇති බැවින්, එම මුදල් අදාළ කථිකාචාර්යවරියගෙන් අය කළ යුතු වුවත්, ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සමාලෝචිත වර්ෂයේද කටයුතු කර නොතිබුණි.

6. **පද්ධති හා පාලනයන්**

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන නොකිරීම |
| (ආ) | වැටුප් පරිපාලන පද්ධතිය | නිසි ප්‍රමිතියකින් යුක්ත ස්වයංක්‍රීය පරිගණක පද්ධතියක අවශ්‍යතාව අවධාරණය කිරීම. |
| (ඇ) | කාර්ය මණ්ඩල පරිපාලනය | බඳවා ගැනීම් විධිමත්ව සිදු නොකිරීම. |
| (ඇ) | ස්වයං මූල්‍ය පාඨමාලා කළමනාකරණය | අතිරික්ත මුදල් නිසි ලෙස පරිහරණය නොකිරීම සහ ගිණුම්කරණ අඩුපාඩු |
| (ඉ) | පර්යේෂණාධාර පිළිබඳ අභ්‍යන්තර පාලනය | පර්යේෂණාධාර උපයෝජනය පිළිබඳ පසුවිපරම් නොකිරීම හා ප්‍රගතිය පරීක්ෂා නොකිරීම. |
| (ඊ) | ගිවිසුම් හා බැදුම්කර පාලනය | අයකර ගත යුතු ගාස්තු අයකර ගැනීම කඩිනම් කිරීමට ප්‍රමාණවත් සැලකිල්ලක් නොදැක්වීම. |
| (උ) | ප්‍රසම්පාදන ක්‍රියාවලිය | ප්‍රසම්පාදන සැලසුම අනුව ප්‍රසම්පාදන සිදුනොකිරීම සහ ගිවිසුම්ගත වීමේ අඩුපාඩු පැවතීම. |